TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපල සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබැන්ක් පාර, කොළඹ 5

2019.11.03

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රජයේ වාහන භාවිතා කිරීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා</u>

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත ලැබුණු පැමිණිල්ලකට අනුව 2019/11/02 දින වීරකැටිය ප්‍රාදේශීය සභාවට අයත් කැබ් රථයක (WP PF- 4007) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට අයත් අත්පත්‍රිකා තොගයක් වීරකැටියේ සිට තංගල්ල දක්වා ප්‍රවාහනය කරන බවට තොරතුරු වාර්තා විය. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය මේ පිළිබඳව හම්බන්තොට දිස්ත්‍රික් තේරීම්භාර කාර්යාලයට එම අවස්ථාවේදීම පැමිණිල්ලක් කරන ලදී.

මෙසේ රජයේ වාහන මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදාගැනීම මගින් 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 5 (I) යන නියමය උල්ලංඝනය වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයාබලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා දකුණු පළාත් සම්බන්ධීකාරක ධනුක ලක්මාල් මහතා හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතාවීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.

මෙයට,

විශ්වාසී,

Lakvijaya Bandara

ලක්විජය බණ්ඩාර

ජාතික සම්බන්ධීකාරක (PPPR)

Reg No. GA 279 Chairperson: S.C.C. Elankovan Company Secretary: Charuni Gunawardana
Directors: Anushika Amarasinghe Shyamala Gomez Camena Guneratne Pavithra Kailasapathy Shreen Saroor T. Someswaran Tony Senewiratne Pulasthi Hewamanna